නැතුව බැරි මිනිහෙක් සිංහ සමාජයේ සිට අර්ධ සංස්කෘතික පිම්මක්

විශ්වාස් පීරිස්

මගේ මා මියගිය දවස් විශාල සමාජයක් අතරතුර තමන්ගේ ගමන අවසන් කළා. ගමේ මිනිස්සු ඒ ගැන කතා කළේ ඔවුන්ගේ ගමේ ලොකු මිනිහෙක් මියගිය බවයි. ඒ මිනිහා ගැන ගමේ මිනිස්සු ලොකු ගරුසරු තිබුණේ ඔහු ගැන ඔවුන් දැක්ක, දැන සිටි, ඔවුන් අතර ජීවිතය ගත කළ ඔහුගේ ගුණ ධර්ම නිසා. ඔහු ගැන ගමේ මිනිස්සු කතා කළේ ඔහු ගැන ඔවුන් දැක්ක, දැන සිටි, ඔවුන් අතර ජීවිතය ගත කළ ඔහුගේ ගුණ ධර්ම නිසා. ඒ ගුණ ධර්ම ඔහුගේ ගමේ ලෝකයේ පොදුවේ ලක්ෂණ ලෙස පිළිගන්නා ලදි. ලෝකයේ විශිෂ්ඨ සිද්ධාන්ත සහ ලක්ෂණවල ඉදිරිපත්කරුවන් සමාජීය සිදුවීම්වලදී ඔවුන් ගැන කතා කළේ ඔවුන් ලෝකයේ විශිෂ්ඨ සිද්ධාන්ත සහ ලක්ෂණවල ඉදිරිපත්කරුවන් ලෙස ඔවුන් ගැන කතා කළ ලක්ෂණ විමසීමය. එහි ගතිකයන් බෙහෙවින්ම හාස්‍යෝත්පාදක වන අතර එහි මතුපිට යථාර්ථය රාජිත පළමු නිමේෂයේදීම ස්පර්ශ කරනු පෙනෙයි. රාජිත එම මතුපිටින් ඉඳුරට නොයන්නේ හාස්‍යෝත්පාදක මතුපිටක් මිස කිඳා යන අන් සංකීර්ණයක් එට නැති නිසාය. පැවැති පාලනයේ මතුපිට මෙන්ම නව පාලනයේ මතුපිට වෙන කිසිදු ආධාරකයක් රහිතව ජයන්තගෙන් ප්‍රකියමාන වෙයි. නාට්‍යය තුළ සාරාර්ථ කාරණය ලෙස ගොඩනැගෙන්නේ දෙවැනි කතිකාවතය. එය [illegible] සිංහලත්වය [illegible] සෙකතා [illegible] ක්මවා, පරාජය කර හෝ වනසා දමා පැවැත්ම සොයා ගැනීමට ප්‍රතිපක්ෂව අනෙකා නොඉක්මවා පරාජය නොකර හා නොවනසා සාමාජීය පැවැත්මක් වෙනුවෙන් පෙනී සිටීමය.

උක්ත කතිකාවත් දෙකම සමාජය තුළ මේ මොහොතේ කැපී පෙනේ. එම පළමු කතිකාවතට ප්‍රේක්ෂාගාරය සිනාසෙන්නේ මන්ද ? ඒ පළමුව භේදයක් ලෙස සිදුවන දෙය දෙවැනුවත් සිදුවන විට එය විගඩමක්වීමේ සිද්ධාන්තයට අනුවය.

පංති නියෝජනයක් නැති මිනිසා

සැබැවින්ම ජයන්තට පංති නියෝජනයක් නැත. දේශපාලන මතයක් ද නැත. පරාජයට පත් වූ ආණ්ඩුවෙහි තදබල ලෙස එල්ලීගෙන සිටි සහ එම කණ්ඩායම සමග තවදුරටත් පසුවන්නන් තුළ පංති හෝ මත නියෝජනයක් නැත. ඇත්තේ එක්තරා ඇබ්බැහියකි. ඇබ්බැහිය සිදුවූයේ හරි හමබ කිරීමට ලැබුණු ධන සම්පත්වල වටිනාකම අනුව විය හැකිය. නැතහොත් ලද වෙනයම් වරප්‍රසාදයක් අනුව විය හැකිය. ධනපතියෙක් වන ඔහුම කෙනෙකුට ධනපති පංතිය නියෝජනය කරන්නට නොහැකිය. ධනපති පංතිය නියෝජනය කරන්නට එම සංස්කෘතිය තුළට පුද්ගලයාත් පුද්ගලයා තුළට සංස්කෘතියත් ආවේනික ලෙස උරාගත යුතුය. එසේ බලන විට ජයන්තට ධනය ඇතත් ඔහුට ධනපති පංතියේ ආවේණික සංස්කෘතිය නැත. ඔහුට ඇත්තේ කෘත්‍රිමව ගොඩනගාගන්නට වෑයම් කරන අසංස්කෘතියකි. ජයන්තට ඇත්තේ වෙළෙඳ සංගමයේ බලය අල්ලා ගැනීම නම් වූ ඔහු වෙසෙන සමාජයේ පුංචි සමාජීය ඉලක්කයකි. එය ජාතික නායකයකු පක්ෂයක බලය තහවුරු කර ගැනීමට යත්න දරීම වැනිම පුංචි ක්‍රියාවකි. වෙනත් අරමුණක් සඳහා වෙනස් කරගත හැකි ජාතිවාදයක් හා ආගම්වාදයක් තිබීම පංති නියෝජනයක් නැති කමේ ලක්ෂණයකි. ජයන්ත පත්වන්නට යන සාදයට සෙනඟ ගෙන්වා ගැනීම වෙනුවෙන් ඔහු දැඩිව ආගමික හා පංතිමය ප්‍රශ්නයක් මත විරෝධය පෑ ක්‍රිකට් ක්‍රීඩකයා සාදයට ගෙන්වා ගැනීමට එකඟ වෙයි. අනෙක් අතට දෙමළ විරෝධයක් තිබුණත් වෙළෙඳ සංගමයේ සභාපතිවීමේ අරමුණ උදෙසා දෙමළ තරුණයා පාවිච්චි කිරීමට පෙළඹෙයි. ජයන්තගේ මැදිහත්වීමෙන් දිස්වන්නේ පංති නියෝජනය වෙනුවට ඇති සරල උපයෝගිතාවාදයකි.

නැතුව බැරි මිනිහෙක් වීම

නැතුව බැරි මිනිහෙක් වීම අසීරු වැඩකි. එහෙත් උපයෝගිතාවාදය තුළ නැතුව බැරි මිනිහෙක්වීම පහසුය. අඟහරු ලෝකෙන් ඇවිත් ආණ්ඩුවක් පිහිටුවූවත් ඒ ඔහුම ආණ්ඩුවක ඇමතිවරු බවට පත්වන පිරිසක් සිටිති. ඒ හැරුණු විට මහා පරිමාණ හොරුන්ට අපි හරකයි කියන පැත්තටත්, අපි හොඳයි කියන පැත්තටත් නැතුව බැරි මිනිස්සු බවට පත්වන්නට හැකිව තිබේ. ඒ අනුව නැතුව බැරි මිනිස්සු වීම පහසුය. අවශ්‍ය වන්නේ ඔහුම තත්ත්වයක් වෙනුවෙන් එම තත්ත්වයේ නිර්මාණකරුවන්ට වඩා තරමක් වැඩියෙන් පෙනී සිටීම පමණි. ජයන්තට ඉදිරියෙන් තිබෙන්නේ ජාතිය සහ ආගමය. ඔහුගේ මහා පරිමාන කොන්ත්‍රාත්, ඉඩම් මිලදී ගැනීම් ප්‍රමුඛ ධනය රැස් කිරීම ඇත්තේ ජාතියට හා ආගමට මදක් පහළිනි. ඒ ක්‍රමය උපයෝගීතාවාදී සමාජයට පිළිගැනීමට සිදුවෙයි. යහපාලන ආණ්ඩුවේ ජනපතිට පවා එවැනි තත්ත්වයකට එක්වීටම එරෙහි වන්නට බය සිතෙනු ඇත. නැතුව බැරි මිනිහෙක් උත්පාදවන්නට එම ක්‍රමය බලපායි. නැතුව බැරි මිනිහෙක් බවට පත්වීමේ ව්‍යාජය පළමු නිමේෂයේදීම හෙළිදරව් වූවත් ඊට එරෙහිව කිසිවකුටත් නිරණාත්මක බලපෑමක් කරන්නට නොහැකිය.

මව සහ භූමිය සෙවීම

රොමේෂ් සුමෙධ සමග ලංකාවට එන්නේ මව සෙවීමටය. මව යනු ආදරයේ කේන්ද්‍රයයි. ආදරයේ කේන්ද්‍රය යනු තමාට අයත් භූමියයි. සුමෙධගේ නැගණිය ඇත්තටම ජීවත්වන බව පෙනෙන්නේ ඇගේ මව හමුවීමෙන් පසුවය. රොමේෂ්ගේ තත්ත්වය ඊට වඩා බරපතළය. ඔහුගේ මාතෘ භූමිය ඔහුට මුළුමනින්ම අහිමි වී තිබේ. අම්මා අහිමි වී තිබේ. ඔවුන් වාසය කළ භූමිය තවදුරටත් තිබෙන්නේ අධි ආරක්ෂක කලාපය තුළය. අපේ ගෙදර තිබුණේ අන්න අතන කියා හමුදා කඳවුරක් ඇතුළට අත දිගු කර පෙන්වන අම්මාවරු මේ මොහොතේදීත් උතුරෙන් හමුවෙති. යුද්ධය නිසා සී සී කඩව ගිය පුළුන් කොටයක් බඳු ජීවිතවලට තවමත් සැනසුමක් ලැබී නැත. ලාංකික සිංහල සමාජයට මෙතෙක් තිබුණේ උන්ගේ ප්‍රශ්න සහ අපේ ප්‍රශ්න පිළිබඳ බෙදීමකි. ජයන්තලාගේ පරම්පරාවෙන් අනතුරුව ඒ බෙදීම අවසන් වී මේ සියල්ල අපේ ප්‍රශ්න යන ස්ථාවරයට සමාජයට උන්නතවීමට හැකි නම් එය මහත් හැඟීම්බර කාරණයකි. මව හා භූමිය සොයායෑම පිළිබඳ කාරණයේ දී රොමේෂ් මෙන්ම සුමෙධගේ නැගණිය තුළ ජනිත වන්නේ සමාන ආතුර භාවයකි. සමාන අනුකම්පක ස්වභාවයකි. ඔවුන් සොයා යන්නේ ආදරයේ කේන්ද්‍රයයි. ආදරයේ නිවසයි ඔවුන් සොයා යන්නේ කිසිසේන්ම අනන්‍යතාව නොවේ. මේ ප්‍රශ්නයේ දී අනන්‍යතාව සොයා යන සෑම විටකම එක්කෝ විරවංස දක්වා හෝ අඩුම තරමින් චම්පික රණවක දක්වා හෝ ඔහුම කෙනෙකුට පසුබසින්නට සිදුවෙයි. රොමේෂ් සුමෙධ මෙන්ම සුමෙධගේ නැගණිය පසුවන්නේ ජයන්තට දුරවබෝධ අනන්‍යතාවක නොවේ. ජාතික අනන්‍යතාව යන්න පසු කරන ලද අවබෝධයකය. අනන්‍යතාව කේන්ද්‍රීය ප්‍රශ්නය බවට පත් කර නොගත් විශ්ව වාසී මිනිසකු හා ගැහැනියක ඔවුහු තමා තුළින් අපේක්ෂා කරති. සිංහබාහුටත්, සිංහසීවලීටත් ප්‍රති පක්ෂව හරස් අරමුණක් රහිත මනුෂ්‍යත්වය පිළිබඳ අදහසකින් මවනා ලද ලන්ඩනයේ සිට කොළඹටත්, කොළඹ සිට කිලිනොච්චියටත් ප්‍රශ්නයකින් තොරව යා හැකි සිංහල දෙමළ තරුණයන් විහිවන්නේ ඒ අනුවය.

චරිතායනය

රාජිතගේ චරිතායනය, (Characterization) නාට්‍යවල චරිතායනය, කතිකාවට වැඩි



මල් කඩන කොල්ලා 14 එළි දකී

අනුසාර මාතිංගොඩගේ දෙවැනි කාව්‍ය සංග්‍රහය මල් කඩන කොල්ලා සැප්. 14 ප.ව 3.00 ට පුස්තකාල ප්‍රලේඛන සේවා මණ්ඩල (දෙවැනි මහලේ) ශ්‍රවණාගාරයේදී එළි දකී. චූලානන්ද සමරනායක හා කේ. කේ. සමන් කුමාර මෙහි දෙසුම් පැවැත්වෙයි. මෙම කෘතිය සපුර ප්‍රකාශයකි.



මායිමිගල කෘතිය දොරට වඩී

මිනින්දෝරු දිවයේ සොඳුරු මතකයන් අළලා බලයලත් මිනින්දෝරු සුනිල් කුසුමසිරි විසින් රචිත 'මායිමිගල' නමැති කෘතිය දොරට වැඩීමේ උළෙල සැප්තැම්බර් මස 15 බ්‍රහස්පතින්දා සවස 3.00ට පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල ශ්‍රවණාගාරයේ දී සර්වේ ජනරාල් තැන්පත් පී.එම්.පී. උදයකාන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. වික්ටර් අයිවන්, දයාලංකාපුර, තිස්ස ප්‍රේමසිරි හා සාමිණී සුමනසේකර මෙහි දෙසුම් පවත්වති.

අලි කලබලය



කර්තෘ: තික්ෂණා විරසේකර (ළමා ලේඛිකා)

තික්ෂණා විරසේකර තවමත් අවුරුදු 9 ක කුඩා දරුවියකි. ඇය ජනාන්තර පාසලක 4 වැනි දරුවෙකි ඉගෙනුම ලබන්නීය.

පරිකල්පන ශක්තිකාව යනු සාහිත්‍ය නිර්මාණයන්ගේ හිඹිරිගෙය වන්නේය. තික්ෂණා දුවනියට පරිකල්පන හැකියාව හොඳින් තිබේ. යමක් සිදුවන ආකාරය දෙස මානසික බැලීමත්, මනසින් දකින දේ ලේඛනයට සැකසීමත්, නිර්මාණ සාහිත්‍යයේදී ප්‍රබල සාධක වන්නේය.

අලි කලබලය තික්ෂණා විරසේකර දුවනිය අතින් බිහිවන්නේ මේ සාධක ඇය සපුරා ඇති බැවිනි.

කේ.කේ. සමන් කුමාරගේ මහිලා වංශය

කේ.කේ. සමන් කුමාර විසින් රචිත නවතම කෘතිය 'මහිලා වංශය' ජනගත කිරීම පසුගිය සැප්තැම්බර් 08 දින සිදු විය. එදින සවස 3.00 ට කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී සිදු විය.

රැජිණ 14 එළි දකී

මොහාන් රාජ් මඩවලගේ අලුත්ම නවකතාව 'රැජිණ' ජනගත කිරීම සැප්තැම්බර් 14 ප.ව. 3.30 ට ජාතික චිත්‍රපට සංස්ථා තරංගනී සිනමා ශාලාවේදී සිදු කිරීමට නියමිත ය. එහිදී මහාචාර්ය ජේ.සී. දිසානායක, ස්වර්ණා මල්ලවාරච්චි, ඩබ්ලිව්. රයසිරි කොටි දෙසුම් පවත්වති. අමිත්ත වීරසිංහ පංචාද මණ්ඩපය මෙහෙයවන අතර මෙහිදී සිදුවන සුවිශේෂී කථිකත්ත වන්නේ මංගල මණ්ඩපයේ 'අලි තරණයි' ආතන්ද රණතුංගගේ 'ලොකු ඒලියන්' කොටි චිත්‍රපටය දෙක ප්‍රදර්ශනය කිරීමයි.

Scan with EasyScan